# අථර්වන් වේද සංස්කෘතියේ මුඛ්‍ය ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්

**කළුවානේ කුමාරකස්සප හිමි**

## අථර්ව වේදය හා එහි සැකැස්ම

මුළු මහත් විශ්වයේම මනුෂ්‍ය වර්ගයාගේ ඓතිහාසික භූමිකාව නිරූපණය කරන ශ්‍රේෂ්ඨතම ග්‍රන්ථයෝ නම් ඍග්වේදය ප්‍රධාන කරගත් සංහිතාවෝයි. මෙම සංහිතා සාහිත්‍යයෙන් භාරතයේ පමණක් නොව පෙරදිග ලෝකයේ විසූ විවිධ ජාතීන්ගේ සිතුම්, පැතුම්, ආචාර විචාර හා ශිල්ප ශාස්ත්‍රයන් කෙරෙහි පෑ බලය සීමා රහිතය. මෙම ඓතිහාසික සාහිත්‍යය තුළ ශ්‍රේෂ්ඨ හා පෞරාණිකත්වය අතින් **ඍග්වේදයට** විශිෂ්ට ස්ථානයක් හිමිවේ. සෙසු වේදත්‍රය අතුරින්ද යජුර් - සාමන් වේදද්වය උසස් ලෙස සැලකිණි. අථර්වේදය ක්ලිෂ්ට ස්වභාවයෙන් යුතුව පවතීය යන්න මත එය පහත්කොට සැළකීමට හේතුවී ඇත. අනෙක් වේදත්‍රය ශුද්ධ ග්‍රන්ථලෙස බමුණුසමාජය පිළිගත් බව සාක්ෂිදරයි.

**අථර්වවේදය** පහත් තත්ත්වයෙහිලා සැලකිණිද? එකල වෛදික සමාජයෙහි දරුවෙකු උපන් හැටියෙම ඔහු වේදයට උපනයනය කිරීම පිළිබඳ ගෘහ්‍ය සූත්‍රයක මෙසේ දැක්වෙයි.

''තොප තුළ මම ඍග්වේදය තබමි, තොප තුළ මම යජුර් වේදය තබමි, තොප තුළ මම සාමවේදය තබමි. තොප තුළ මම වාක්බ්‍යොවාක්‍යයන් සහ ඉතිහාස පුරාණයන් තබමි. තොප මම සියලු වේදයන් තබමි'' **(වින්ටර්නිට්ස්, 1967: 94).**

මෙම පාඨයෙහි ඕනෑකමින්ම **අථර්ව වේදය** බැහැරකොට ඇත. **අථර්වවේදය** අනෙක් වේදත්‍රය හා සමතැන්හි ලා නොසලකන ලද්දේ මන්ද?

**ඍග්වේදය** ප්‍රමුඛකරගත් යජුර් - සාමන් වේදයන් භාරතය

ආක්‍රමණය කළ ආර්යයා නමින් හැඳින්වෙන සුදු - හමක් ඇති ජනයාගේ ජීවිත හා ඇදහිලි විශ්වාස ඇතුළත් වූ ග්‍රන්ථයෝයි. මෙම ග්‍රන්ථයන් හුදෙක් ඍග්වේද ආගමේ දෙවියන් පිළිබඳ ශුද්ධ වූ ග්‍රන්ථයෝයි. අර්ථවවේදයෙන් පිළිබිඹු වනුයේ අනායර්‍ය වූ හෙවත් ආර්යයන් භාරතය ආක්‍රමණය කරන කල එහි විසූ ස්වදේශීය කාලවර්ණ දේහධාරීන්ගේ ඇදහිලි හා විශ්වාසයන් ය. **අථර්වවේද** අන්තර්ගතයේ ඇති අයහපත්, අශුභ දේවල් කරණකොට ආයර්‍යයන් මෙම වේදය වර්ජනය කිරීමට ප්‍රයන්ත දරා ඇත. වේද ගණයෙහිලා සැලකීමට පසුබට විය.

ආයර්‍යයෝ මෙම වේදය නොසලකා හැරීමේ ප්‍රයත්තය වැඩිකල් පවත්වා ගැනීමට නොහැකි වූහ. ඒ සඳහා කිසියම් හේතු කිහිපයක් බලපා ඇත. අන්‍යොන්‍ය සම්බන්ධයක් නොමැති පරස්පර විරෝධී අදහස් - උදහස් හා සිරිත් - විරිත්වලින් යුත් සමාජයන් දෙකක් අත්වැල් බැඳගෙන එහෙත් සිය සිරිත් - විරිත් වෙනස් නොකොට මිත්‍රත්වයකින් හෝ සුහදතාවයකින් පසුවීමට නොහැකිය. එහිදී තෝරාගත යුතු මාර්ග කිහිපයකි.

එක් සමාජයක් අනෙක් සමාජය අභිබවා ප්‍රතිවිරුද්ධවාදියා මූලෝත්පාඨනය කළ යුතුය.

ඔවුන්ගේ අදහස් - උදහස් උකහාගෙන සම්මුතියකට පැමිණිය යුතුය.

සිය අදහස් උදහස් යටපත් වීමට ඉඩහැර ඔවුන්ගේ අදහස් - උදහස් පිළිගත යුතුය.

මෙම මාර්ග තුනෙන් පළමු හා තෙවැනි මාර්ග ක්‍රියාත්මක කළ නොහැකිය. පළමු මාර්ගය ක්‍රියාත්මක කිරීමට නොහැක්කේ ආයර්‍යයන්ගේ සංඛ්‍යාව අනායර්‍යයන්ගේ සංඛ්‍යාවට වඩා අඩුවීම යි.

තෙවැන්න කළ නොහැක්කේ ආයර්‍යයන්ගේ ජාතිකාභිමානය නිසාය. අනායර්‍යයන්ට යටත්වීමට ඔවුන් කෙසේවත් කැමති නොවේ. කළ හැකි එකම ක්‍රියා මාර්ගය දෙවැන්නයි. එනම් අනායර්‍යයන්ගේ අදහස් උදහස් පිළිගෙන ඒවා තමාගේ දර්ශනයට අනුකූලව නව මුහුණුවරක් දීමයි. **අථර්වවේදය** එවැනි නිර්මාණයකි. මෙහි අන්තර්ගතය පිළිබඳව පසුවට කෙරෙන විපරම් කිරීමේදී ඒ බව මනාව පැහැදිලි වෙයි.

මුලදීම අපගේ අවධානය යොමු කරනුයේ මෙහි සැකැස්ම පිළිබඳවය. අර්ථවවේදය විවිධ නම්වලින් හඳුන්වනු ලැබේ.

අථර්වවෙද

බ්‍රහමවෙද

අඞ්ගිරොවෙද

අථර්වඞ්ගීරසවෙද

භෛෂජ්‍යවෙද

ක්‍ෂත්‍රවෙද

භෘග්වඞ්ගීහිරසවෙද

අථර්වෙද යන්නෙහි නිර්වචනය නොයෙක් ආකාරයෙන් දක්වේ. ඍග්වේද සංහිතාවෙහි ''අග්නිජීාතො අථර්වණා'' **(X.21.5)** ''ඉමමුත්‍යමථර්වදග්නිං මන්‍ථන්ති වෙධසඃ'' **(VI.15.32)** යැයි මන්ත්‍රවල යඥමාර්ගයාගේ ප්‍රථම මාර්ගය මෙයය යන අර්ථයෙන් අථර්ව වී යැයි කියවේ. **(සෝමාරාම, 1952: 6)**

අථර්වවේද යන්නෙහි අදහස අථර්වන්ගේ වේදය හෙවත් යන්ත්‍ර - මන්ත්‍ර ඥානයයි.

ඉන්දීය සාහිත්‍යයෙහි මේ වේදයට දී ඇති ඉපැරණිම නම ''අථර්වාඞ්ගීරස'' යන්නයි. අථර්ව යනු ශුභ, යහපත් යන තේරුම දෙයි. අඞ්ගීරස් යනු අශුභ, අයහපත් යන්නයි. පසුකල අඞගීරස් කොටස ඉවත් වී ඇත. අනායර්‍ය ජනයා අතර මෙම ශුභ හා අශුභ යන්ත්‍ර - මන්ත්‍ර ගුරුකම් - අභිචාරවිධි (Ritual) පැවති පසුව ආයර්‍ය සංස්කෘතිය හා මිශ්‍රවීම් ඵලයක් ලෙස අථර්වවේදය නිපදවිණි.

අථර්වවේදය සුක්ත 731 කි. මන්ත්‍ර සංඛ්‍යාව 6000 කි. කාණ්ඩ වශයෙන් 20 කි. ප්‍රපාඨක වශයෙන් 38 කි. අනුවාක 90 කි. අථර්වවේදයෙහි ප්‍රධාන ශාඛාවෝ ශෞනකය, පෛප්පලාද යැයි දෙකොටසකි. මෙයින් අථර්වවේදය පිරිසිදු ලෙස රැකි ගුරුකුලය ශෞනක ගුරු කුලයයි. ''ශෞනක සංහිතාවෙහි අඩංගු කාණ්ඩ විස්සෙන් දහ අටක් පැරණි යැයිද අග දෙක පසු කාලීනව ඇතුළත් - කරන ලදැයිද පිළිගැනීමයි.'' **(හෙට්ටිආරච්චි,1964:40).**

මෙහි විසිවන කාණ්ඩය සම්පූර්ණයෙන්ම පාහේ රචිතව ඇත්තේ ඍග්වේද සංහිතාවෙන් උපුටාගන්නා ලද සූක්තයන්ගෙනි. අථර්වවේදයෙහි හතෙන් එකක් ඍග්වේදයෙන් ගත් සූක්තයෝය.

අථර්වවේදයෙහි සැකැස්ම පිළිබඳ අවධානය යොමු කරන විට එහි ක්‍රමවත් බවක් දක්නට ලැබේ. පළමු අධ්‍යායයේ සූක්තයන්හි පද්‍ය හතර බැගින්ද, දෙවැන්නෙහි පද්‍ය පහ බැගින්ද, තෙවැන්නෙහි හය හයද, සිව්වැන්නෙහි හය හතද වේ. අපරදිග පඬුවෝ අථර්වවේද සූක්ත වින්‍යාසය අනුව එය කොටස් තුනකට පැහැදිලි කරයි.

පළමු පරිච්ඡේදයේ සිට හත්වැන්න දක්වා විවිධ විෂයයන් මාතෘකා වශයෙන් ගත් කෙටි සූක්ත සහිත කොටස.

8 - 12 දක්වා විවිධ විෂයයක් මාතෘකා වශයෙන් ගත් දිග සූක්ත සහිත කොටස

13 - 18 දක්වා එක එක විෂයයක්ම වෙන් වශයෙන් සංග්‍රහ කරන පරිච්ඡේදවලින් යුත් කොටස.

**අථර්වවේදයෙහි අන්තර්ගතය**

අථර්වවේදයෙහි අන්තර්ගතව ඇත්තේ මන්ත්‍ර හා පූජාවිධිය. මෙම මන්ත්‍ර හා පූජාවිධි ප්‍රධාන වශයෙන් කොටස් 10 කට බෙදෙයි.

01. ශාන්තික - දුෂ්ට බලවේග එලවා හැරීම සඳහා භාවිත මන්ත්‍ර පූජාවිධි.
02. පෞෂ්ටික - දියුණුව සහ සමෘර්ධිය ලබා ගැනීම සඳහා භාවිතය
03. වශ - වසඟ කර ගැනීමට හෝ දමනය කිරීමට භාවිතය
04. ස්තම්භන - දියුණුව හෝ අභිවෘද්ධිය අක්‍රිය කිරීමට භාවිතය
05. මෝහන - මුළා කිරීම පිණිස භාවිතය
06. ද්වේෂණ - භේද කිරීම, ද්වේෂය පතුරුවාලීමට භාවිතය
07. උච්චාටන - පලවාහැරීම, බැහැර කිරීම සඳහා භාවිතය

08. මාරණ - මැරීම සඳහා භාවිතය

09. ආකර්ෂණ - පොලඹබා ගැනීම සඳහා භාවිතය

10. විද්‍රාවණ - බිය පත්කොට එළවා දැමීම සඳහා භාවිතය

උක්ත කොටස් 10 ට අයත් X මන්ත්‍ර හා පූජාවිධි පිළිබඳ තොරතුරු මෙහි අන්තර්ගතය.

අන්තර්ගතය තවත් කොටස් දෙකකට බෙදිය හැකිය.

01. ඓහික - මෙලොවට අයත් කටයුතු

02. ආමුෂ්ටික - පරලොවට අයත් කටයුතු

**අථර්වවේදයෙහි** සූක්තවල අන්තර්ගත වශයෙන් ප්‍රධාන කොටස් කිහිපයකට සංග්‍රහකර ඇත. මෙම සංග්‍රහ කිරීම විෂයයන් කිහිපයක් යටතේ සංග්‍රහ කල හැකිය.

**1. භෛෂජ්‍යානි සූක්ත**

මේවා බෙහෙත් සූත්‍රයෝයි. විවිධ රෝග සඳහා භාවිත බෙහෙත් විස්තරවෙයි. එහි විස්තරවන රෝගයන් කිහිපයක් මෙසේයි.

| | |
|---|---|
| තක්මන් (උණ) | ▪ ශ්වේත කුෂ්ඨ (සුදු කබර) |
| අශ්‍රාව (අතීසාරය) | ▪ පාණ්ඩු |
| හරිමාණ (කහ උණ) | ▪ මූත්‍රරෝධ |
| ජලෝදර (බඩ පිපීම) | ▪ මළබද්ධ |

මෙවැනි රෝග විශාල සංඛ්‍යාවක ලක්ෂණ විස්තර සහිතව පැහැදිලිව වර්ණනා කර ඇත. මන්ත්‍ර බලයෙන් රෝගය ඈතට යැවීම සිදු කරයි. ඇතැම් මන්ත්‍රවල රෝගාබාධයෝ අවශේෂ ජනයා වෙත යවති. අථර්ව වේදයේ VI, 105 වන මන්ත්‍රයේ බලයෙන් කැස්ස රෝගියාගෙන් ඉතා ඈතට පළවා හරිනු ලබයි.

''එම්බා කැස්ස, ආත්මය ආත්මයේ ආශාවන්ද කැටිව වහා දූරිභූත වන්නාසේ තෝද ආත්මය යන මඟ ඔස්සේ ම පලා යව.

එම්බා කැස්ස, තියුණු මුවාතක් ඇති ඊතලයක් ක්ෂණයෙකින් ඈතට ඉගිලයේද, තෝද පොළවේ පළල ඇති තාක් ඉගිල යව, එම්බා කැස්ස, ඉරුගේ රැස් ක්ෂණයෙන් ඈතට විහිදයේද, තෝද මුහුදු ජලය ඔස්සේ පලා යව'' **(වින්ටර්නිට්ස්, 1967: 97 - 98).**

**2. ආයුෂ්‍යානි සූක්ත**

මෙම සූත්‍ර භාවිතකරනුයේ ආයුෂ වැඩිකර ගැනීම සඳහායි. මෙම මන්ත්‍ර පවුලේ විවිධ උත්සව අවස්ථාවන්හි දී භාවිත කර ඇත. පළමුවරට පුතාගේ කෙස් කැපීමේදී, රැවුල මුඩු කිරීමේදී, උපනයනයෙහිද යනාදී අවස්ථාවන්හි මේ මන්ත්‍ර සෙත් සලසනු පිණිස යෙදේ.

**3. ආභිචාරිකානි සූක්ත**

මෙම සූක්තවලට මාතෘනාමානි/ කෘත්‍ය ප්‍රතිහරණානි යන නාමයන්ද භාවිත කෙරේ. මෙයින් කෙරෙනුයේ යක්ෂයන්, ප්‍රේතයන් එලවා හැරීමයි. පිශාචයන් හා රාක්ෂසයන් රෝගාබාධ ඇති කරයි. ඔවුන් එළවා හැරීම සඳහා විවිධ පැළෑටි වර්ග, ඖෂධ උපයෝගි කර ගනියි. මිනිසුන්ගේ නිවෙස් අතහැර ගංගාවන්, වෘක්ෂයන් කරා මෙන්ම පාතාලයට යැවීම මෙම මන්ත්‍රවලින් සිදු කරයි. අථර්වවේදයේ VI, 37 ගීතය එවැන්නකි.

''එකෙක් බල්ලෙකු වැනිය. එකෙක් වඳුරකු වැනිය. සපිරුණු කෙස් කළඹකින් යුත් කුමාරයෙකු මෙන් දැකුම්කලු බවට පැමිණ ගන්ධර්වයා ස්ත්‍රිය අවට හැසිරෙයි. අපගේ වීර්‍ය්‍යවත් මන්ත්‍රයේ බලයෙන් ඔහු මෙතැනින් පලවා හරිමු'' **(වින්ටර්නිට්ස්, 1967:101).**

**4. ස්ත්‍රීකර්මාණි සූක්ත**

මෙම ස්ත්‍රීකර්ම ශුභදායක හා අශුභදායක කොටස් දෙකට ම අයත්ය. කාන්තාවකට වැළඳෙන රෝගාබාධ ඉවත් කිරීම, පුරුෂයෙකු ලබා ගැනීමට කරන වශීකර්ම, ස්ත්‍රියකගේ ආලය දිනා ගැනීම සඳහා යොදා ගන්නා මන්ත්‍ර, ස්ත්‍රියක් වඳ බවට පත් කිරීමට හා වඳ ස්ත්‍රීයක් සරුබවට පත් කිරීම සඳහා යොදා ගන්නා මන්ත්‍ර, ගැබ්හෙළීම හා ගැබ් ආරක්ෂා කිරීම, පුරුෂයන්ගේ උත්පාදක ශක්තිය නැති කිරීම, විවාහක

අඹු සැමියන් භේද කිරීම ආදී විවිධ ස්ත්‍රීන් සම්බන්ධ කටයුතු සඳහා මෙම මන්ත්‍ර යොදා ගනියි.

පිරිමියෙකු දිනා ගැනීම සඳහා ගැහැණියක භාවිත කරන මන්ත්‍රයක් අථර්ව වේදයේ IV, 130 සහ 138 ගීතයන්හි එයි.

''එම්බාමරුත්ස්, ඔහු උමතුවට පමුණුවනු ! උමතුවට පමුණුවනු ! උමතුවට පමුණුවනු ! එම්බා වාතයෙනි, ඔහු උමතුවට පමුණුවනු ! එම්බා අග්නි, ඔහු උමතුවට පමුණුවනු ! මා කෙරෙහි බඳ කාමයෙන් හෙතෙමේ විදිනු ලබාවා!'' **(වින්ටර්නිට්ස්, 1967:106).**

**5. සාම්මනස්‍යානි සූක්ත**

සත්පුරුෂයන්ගේ ගෞරව ලැබීමට, සමාජයේ ඉහළ ස්ථානයක් ලැබීමට, සමෘද්ධිය ලැබීමට, මව්පියන් - දරුවන් අතර සමඟිය වර්ධනය කිරීමට, සහෝදර සෙනෙහස වර්ධනය කිරීමට, පවුලේ සාමය රැකීමට, වැනි කටයුතු සඳහා මෙම මන්ත්‍ර හා පූජාවිධි භාවිත කරනු ලබයි.

**6. පෞෂ්ටිකානි සූක්ත**

මෙම සූක්ත වල අන්තර්ගත කරුණු අනුව පහත කාර්යායන් සඳහා භාවිත බවට කරුණු යෙදේ. දේපළ ආරක්ෂාකර ගැනීම, වෙළදාම් කටයුතුවලදී සොර සතුරන්ගෙන් ආරක්ෂාව ලැබීම, ගොවිතැන් කටයුතුවලදී වැඩි අස්වැන්නක් ලබා ගැනීම, නිසි කල්හි වර්ෂාව ලැබීම, ගව සම්පත වැඩි දියුණු වීම, ගින්නෙන් හා ජල ගැලීම් වලින් නිවාස/දේපළ ආරක්ෂා කිරීම, කෘමි උවදුරු දුරුකර ගැනීම ආදී ගොවියා, එඬේරා හා වෙළෙන්දා යනාදීහු ලෞකික සැප විඳ සමෘද්ධිමත් ජීවිතයක් ගත කිරීමට පතති.

**7. ප්‍රායශ්චිත්තානි සූක්ත**

මෙම සූක්තයන් පව්සමාකර ගැනීමේ සූක්ත ලෙස හැඳින්වෙයි. එහි සඳහන් වන පාපයෝ මෙසේය. නිවුන් දරුවන් ලැබීම, නිවුන් වසු පැටවුන් ලැබීම, වැඩිමලාට පෙර බාලයා විවාහ වීම, යටි ඇන්දේ කිරි දතට පෙර උඩු ඇන්දේ දතක් ඒම, බකමුහුණන් හා වඳ ගවදෙනුන්

දැකීම, නපුරු සිහින දැකීම, සූර්යයාට මුහුණලා සිට මූත්‍ර පහ කිරීම ආදියයි. එවැනි පාපයන් සිදු වූ විට ඒවා බැහැර කරලීමට මෙම සූක්ත කියා පූජා කටයුතු කළ යුතුයි.

### 8. රාජකර්මාණි සූක්ත

රජවරුන් භාවිත කරන මන්ත්‍ර හා යාග විධීහුයි. මෙම මන්ත්‍ර පුරෝහිත දැනගත යුතුයි. යුධ කටයුතු, අභිෂේක කටයුතු, නව රාජ්‍යයක් බාර ගැනීමේදී භාවිත රාජකම්, රජෙක් බලයෙන් පහකිරීම සඳහා භාවිත මන්ත්‍ර ආදිය රාජකර්මාණි සූක්තවල අන්තර්ගතය.

මෙම සූක්තයන්ට අමරතව තවත් විවිධ සූක්තයන් දක්නට ලැබෙයි. ඒවා අතර

ශාප කිරීම සඳහා භාවිත සූක්ත

දාර්ශනික ගණයේ සූක්ත

විශ්වය සහ එහි ස්වභාවය පිළිබඳ සූක්ත

විශේෂ අරුතකින් තොර සාමාන්‍ය සූක්ත

අථර්ව වේදයෙහි අන්තර්ගතය පිළිබඳව ''හොප්කින්ස්'' නැමැති විචාරකයා තම The Religions of India කෘතියෙහි මෙසේ සඳහන් කරයි.

''ඍග්වේදයේ සූක්ත නිරවුල් කළ නොහැකි සේ අවුල් වී තිබීම, පූර්ව යුගයක දේවාතාවන් ආකුල කරගෙන තිබීම, යළිත් ඔවුන් දැනට සම්පූර්ණව පවත්නා දේවතා ගණයකට මිශ්‍රකර ගැනීම, අපූර්ව දෙවියන් වැද්ද ගැනීම, වද දෙන නිරයක් පිළිගැනීම, බොහෝ දේවතාවන් වෙනුවට සියළු දෙවියන් හා ස්වභාව ධර්මයද නිරූපණය කරන කෙනෙකු සිටීම, දුෂ්ට අභිප්‍රායන් සඳහා ජපකිරීම් හා යහපත් අභිප්‍රයන් සඳහා මන්ත්‍ර, මා ද්වේෂ කරන්නන්ට හා මට ද්වේෂ කරන්නන්ට විරුද්ධව එල්ල කළ හැකි ශාප වාචක තන්ත්‍ර, දරුවන් ලබා ගැනීමට, ආයුෂ දිගුකර ගැනීමට, දුෂ්ට මන්ත්‍ර ගුරුකම් දුරලීමට, විෂවලින් හා වෙනත් ආපදාවලින් ආරක්‍ෂා වීමට භූත විද්‍යාත්මය ශ්ලෝක, යාගයේ ''අවශිෂ්ටය'' දේවත්වයට නැංවීමෙන් දැක්වෙන

පූජාවිධිමය ගෞරවයේ අඩපණ කරවන අන්තගාමිත්වය, සර්පයන්ට, රෝගවලට, නින්ද, කාලය, හා තරු සඳහා සූක්ත, දුෂ්ට පූජකයාට ශාපකිරීම් **ඍග් වේදය** කියවීමෙන් පසුව අථර්වනය කියවීමෙන් ඇතිවන හැඟීම දළ වශයෙන් මෙබඳුය'' **(රාධා ක්‍රිෂ්ණන්, 1970:82).**

**අථර්වවේද සංස්කෘතියෙහි මුඛ්‍ය ලක්ෂණ**

**අථර්වවේද** සංස්කෘතියෙහි මූඛ්‍ය ලක්ෂණ පිළිබඳ විමංසනය කිරීමේදී **ඍග්වේද** සංස්කෘතිය හා තුලනය කිරීම සුදුසුය. මෙහිදී ඍග්වේද සංස්කෘතිය වශයෙන් සැලකීමේදී යජුර් - සාමන් වේදයන්හි සංස්කෘතියද එකටම සලකනු ලැබේ. මන්ද එම වේදද්වයද **ඍග්වේදය** මතම යැපෙන බැවිනි. අථර්වේද සංස්කෘතිය **ඍග්වේද** සංස්කෘතිය හා සමානකම් වලට වඩා වෙනස්කම් බොහෝය. අථර්වේද සංහිතාව වඩා මෑත යුගයකට අයත් එකක් වුවද අථර්වවේදයෙහි නිරූපනය වන අද්භූත ආගම ඍග්වේදයේ ආගමට වඩා පැරණිය. වෛදික ආර්යයන් ඉන්දියාවට පැමිණෙන කල්හි ඔවුනට මුණගැසෙනුයේ නයින්, සර්පයින්, ගස්, ගල් පුදන ම්ලේච්ඡ වනචාරී අශිෂ්ට මනුෂ්‍ය වර්ගයකි. ''රාධාක්‍රිෂ්ණන්'' මහතා පවසනුයේ ''ඍග්වේදය ඉන්දියානු පුරාවෘත්ත විසින් දෙවියන්ගේ හා රාක්ෂසයන්ගේ ගැටුමක් බවට පත්කරන සුදුහම ඇති ආර්යයයන් හා කෘෂ්ණදස්‍යුන් අතර වූ සට්ටනයේ කාලය විස්තර කරන අතර, අථර්වවේදය ගැටුම සංසිඳී දෙපක්ෂය අන්‍යෝන්‍ය ආධාරය ඇතිව සමගියෙන් ජීවත්වන්නට උත්සහ ගන්නා කාලය පිළිබඳව විස්තර කරයි'' **(රාධා ක්‍රිෂ්ණන්, 1970:83).**

මෙම නිබන්ධනයේ අථර්වවේදයෙහි අන්තර්ගතය හා ග්‍රන්ථවින්‍යාසයේ පැහැදිලිව පෙනුණු එක වැදගත් කරුණක් නම් **අථර්වේදය** ''පොදුජනයාගේ වේදය'' (veda of the masses) බවට පත්වීම පමණක් නොව මිථ්‍යාමත, භූතවිශ්වාස, ජන සම්මත ඇදහිළි යනාදිය සිත්හි ඇති කරගෙන ජීවත්වන නූගත් ජනයාගේ ආප්ත ග්‍රන්ථයක් බවටද පරිවර්තනය වීමය. අථර්වේද සංස්කෘතියෙහි දක්නට ලැබෙන එක් ලක්ෂණයක් නම් ඔවුහු භූත, ප්‍රේත, පිශාච, රාක්ෂස යනාදීන්ගෙන් ගහනවූ පරිසරයක තමන් ජීවත්වන බව සිතූහ. එයින් පැමිණිය හැකි උවදුරු, හිරිහැර වැළැක්වීම පිණිස නොයෙකුත් මන්ත්‍ර, තන්ත්‍ර හා ගුප්තවිධි යොදා ගත්හ.

**අථර්වවේද** යුගයේ රෝග බියෙන් හා මරණ බියෙන් පෙළුණු ජනයා රෝග හා මරණය ඇතැම් රකුසන්ගේ ක්‍රියාවන් යැයි සිතා ඒ ඒ රකුසන්ගෙන් සිය ජීවිත මුදාගැනීමට යාඥා කළේය. **ඍග්වේද** සංස්කෘතියේ දක්නට ලැබෙන්නේ යාග හෝමාදි ක්‍රියාවන්ට අගතැන්දීම, බමුණන් ශ්‍රේෂ්ඨත්වයට පැමිණීම සහ ප්‍රසන්න සිතකින් ජීවිතයට මුහුණපෑම යන ලක්ෂණයෝයි. **අථර්වවේද** සංස්කෘතිය මීට වෙනස් වූවකි. එහි සමාජය රෝදුක්වලට ගොදුරු වූ, මන්ත්‍රකරුවන් හා ගුප්ත බලධාරීන් ආදීන්ගේ බලපෑමට ජීවිතයේ හැම අවස්ථාවෙහිම ලක්වූ, බියෙන් හා ප්‍රවේසමෙන් දිවිපෙවෙත රැකගත් මිනිසුන්ගෙන් යුතු වූ එකකි.

**ඍග්වේද** සංස්කෘතියෙහි පැනෙන්නේ ස්වභාව ධර්මයේ ප්‍රාතිහාර්‍ය ජනකවූත්, තේරුම්ගත නොහැකිවූ ශක්ති විශේෂ දේවත්වයට නඟා ගෞරවයෙන් භක්තියෙන් හා ප්‍රසාදයෙන් වර්ණනා කළ දේව පිරිසකි. **අථර්වේද** සංස්කෘතියෙහි මෙම දේව පිරිසට වඩා මිනිසුන්ට බලවත්ව පෙනෙන්නට වූයේ මිනිසුන්ට හිරිහැර කරන භූත, පිශාච, රාක්ෂ යන දරුණු අදෘශ්‍යමාන බලවේගයන්ගෙන් පිරුණු ලෝකයකි. ස්වභාව දහමේ දේවාරෝපණයෙන් වෛදික ආර්‍යයා තම අවශ්‍යතා ඉටු කරගැනීමට තුති ගී ගයා කන්නලව් කොට පූජාවක් තබා යාග කළේය. අථර්වේද සංස්කෘතියේ දී එය වෙනස් විය. ඔවුහු දෙවියන් ප්‍රධානත්වයෙන් නොසැලකූහ. දේවියන්ට පූජා පවත්වන බ්‍රහ්මණයාද ප්‍රධාන නොවූහ. ඔවුහු ප්‍රධාන කරගත්තේ භූත ලෝකයයි. සහන ඉල්ලා යාඥා කළේ මොවුන්ගෙනි. යාග පූජාව වෙනුවට යන්ත්‍ර - මන්ත්‍ර, අනවින, ශාප ප්‍රධාන විය. ඒවා සිදු කරන කට්ටඩියා බමුණාට වඩා වැදගත් විය. උසස්විය. මේ ලක්ෂණය අථර්වේද සංස්කෘතියෙහි වැදගත් ලක්ෂණයකි.

**අථර්වේද** සංස්කෘතියෙහි දක්නට ලැබෙන ආයුර්වේදයට ඉඩ ප්‍රස්ථා සැලසීම තවත් ලක්ෂණයකි. ආයුර්වේදයේ ආරම්භය ලෙස සලකන භෛෂජ්‍ය සූක්තවල විවිධ රෝග පිළිබඳවත්, රෝග කාරක අමනුෂ්‍යයන් හා පණුවන් පිළිබඳවත් ඒවාට යෙදිය යුතු පිළියම් පිළිබඳවත් විස්තර වේ. බෙහෙත් පැළෑටිවලට ජපකිරීම, ජලයට ආයාචනය කිරීම, අග්නි දේවතාවාගේ සහාය පැතීම, වැනි දෑ එහි සඳහන් වේ. **අථර්වවේද** සංස්කෘතිය තුළ විවිධ රෝග සඳහා කරන ලද

මේ ප්‍රතිකාර ක්‍රමවේද පිළිබඳව විමංසනය කිරීමේදී මෙම මන්ත්‍රවල අඩංගුවනුයේ ස්වයංයෝජනාත්මක හා සංකේතාත්මක කරුණුය. මන්ත්‍රයක් සමඟ භෞතික ද්‍රව්‍යයන් එකතුව ක්‍රියා කිරීම අථර්වවේද සංස්කෘතියෙහි සුවිශේෂ ලක්ෂණයකි. එවැනි රෝග වර්ණනා කිරීම සඳහා යොදාගත් උපමා කිහිපයක් **අථර්වවේදයෙහි** 1.17 වන සූක්තයෙහි ලේ ගැල්ම නැවැත්වීම පිණිස සකස් කරන ලද ගීයක් එයි.

''ලේ පැහැති වස්ත්‍ර පැළඳි මේ ස්ත්‍රීන් මෙන් දුවන නහර දූන් දුර්වලව, ශක්තියෙන් හීනව, සොහොයුරන් රහිත සොහොයුරියන් මෙන් නිසලව සිටීවා'' **(තිලකසිරි, 1958:57).**

අථර්වවේද සංස්කෘතියෙහි පැහැදිලිවන තවත් කරුණක් ලෙස රෝග පීඩාදියෙන්, අඩු ආයුෂ ඇතිව මියයන පිරිස බොහෝ බව පැහැදිලි වෙයි. ආයුෂ්‍ය සූක්තවල දීර්ඝායුෂ වැඩි කර ගැනීම සඳහා අනුගමනය කරන පිළිවෙත් ඉදිරිපත් කරයි. එකල සමාජයේ වැඩිදෙනා රෝග උවදුරු බියෙන් විසූ බවත් පැහැදිලි වෙයි. විවිධ රෝග සඳහා මිථ්‍යා භූත බලවේගවලින් පිහිට යැදීමත්, සුදුසු ස්වභාවික ඖෂධ සංයෝගයක් යොදා ගැනීමත් එකල සමාජය හුරු වී ඇත. යකැදුරා සියල්ලටම වඩා බලවත්ව විසූ බව පැහැදිලි වෙයි.

අථර්වේද සංස්කෘතියෙහි විසූ ජනයා තම ජීවිකාවෘත්තිය ලෙස ගෙවිතැන, සත්ත්වපාලනය හා වෙළෙඳාම යොදාගත් බව පෙනේ. අථර්වවේද පෞෂ්ටික සූක්තවලදී ගොවියා, එඬෙරා හා වෙළෙන්දා වැනි වෘත්තීන් තම කටයුතු සාර්ථකත්වය හා සෞභාග්‍ය අපේක්ෂා කරමින්ද, එකී ව්‍යාපාර අතුරු අන්තරායවලින් ආරක්ෂාවීම් වශයෙන්ද යොදාගත් බව පෙනේ. තවත් සුවිශේෂී ලක්ෂණයක් ලෙස අපරාධයන් හා පාපයන් සමනය කර ගැනීම සැලකිය හැකිය. ප්‍රායශ්චිත් සූක්ත සදාචාරාත්මක පැවැත්ම කෙරෙහි සමාජයේ වූ ඇල්ම ප්‍රකට කරයි. ඒ මන්ද, එකල සමාජයේ සදාචාර පරිහාණිය දැඩිව පවත්නට ඇති බැවිනි.

ස්ත්‍රීන්ට අථර්වවේද සංස්කෘතියෙහි විශේෂ තැනක් හිමි වී ඇත. ස්ත්‍රීන්ගේ ජීවිතයේ වැදගත් අවස්ථාවලදී භාවිත කරන විශාල මන්ත්‍ර සංඛ්‍යාවකින් යුක්තය. සෙත් ශාන්තිය පැතීම මෙන්ම ස්ත්‍රීන්ට විත කිරීම ද එකල පැවතී ඇත. විශේෂයෙන් දරුවන් නැති වඳ ස්ත්‍රීන්

පහත් කොට සළකා ඇත. රෝග ආදිය ඔවුන් වෙතට පහ වේවායි පතයි. ස්ත්‍රීන් වසඟ කරගැනීමට, ඔවුන්ට ගර්භ බන්ධනය කිරීම වැනි කටයුතු සිදු කොට ඇත.

අථර්ව වේදයෙන් පැහැදිලිවන තවත් සංස්කෘතික ලක්‍ෂණයක් ලෙස වෛදික සංස්කෘතිය හා මිශ්‍රවීම සැලකිය හැකිය. වෛදික යුගයේ පැවති සංස්කෘතික ලක්‍ෂණ හා අථර්වවේදයෙන් පැනෙන එකල සංස්කෘතික ලක්‍ෂණ මිශ්‍රවීමක් සිදු වී ඇත. ඒ අනුව ආර්‍ය හා අනාර්‍ය මිශ්‍ර සංස්කෘතික ලක්‍ෂණ අථර්ව වේදය පෙන්නුම් කරයි. එකල දාර්ශනික සංකල්පද නොතිබුණේ නොවේ. ලෝක නිර්මාණය හා ලෝක සංරක්‍ෂණය කරන ප්‍රජාපති පිළිබඳව කරුණු මෙහි ප්‍රකාශවෙයි. බ්‍රහ්මන්, තපස්, මනස්, අසත්, ප්‍රාණ වැනි මාතෘකා එකල සමාජයේ කතාබහට ලක්වී ඇත.

අවසාන වශයෙන් නිගමනය කළහැකි කාරණවක් නම් ආර්‍ය - අනාර්‍ය භේදය තුළ ආර්‍යයන් මැඩපවත්වමින් අනාර්‍යයන් මතුවීම **අථර්වවේදයෙන්** පැණෙන බවයි. ආර්‍ය සංස්කෘතිය විසින් පැරණි අනාර්‍ය සංස්කෘතිය යටපත් කරගෙන සිටියද එය එතරම් කලක් පසුවීමට තරම් ශක්තිමක් නොවීය. අනාර්‍යයන් තම බලය තහවුරු කරගැනීම නිසා අනාර්‍යයන්ට ඔවුන් හා මිශ්‍ර වීමටත්, ඔවුන්ගේ මතවාද පමණක් නොව ආගමික විශ්වාස ද පිළිගැනීමට සිදු විය. මේ අනුව අථර්වේද සංස්කෘතිය ආර්‍ය - අනාර්‍ය මිශ්‍ර සංස්කෘතියක් බව නිගමනය කළ හැකිය. එහි ආර්‍ය සංස්කෘතියේ හා අනාර්‍ය සංස්කෘතියෙහි ලක්‍ෂණ අඩංගුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


තිලකසිරි, ජයදේව. (1958). **වෛදික සාහිත්‍යය.** කොළඹ, සී. ස. එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම.

පැට්රික්, නාරාවිල. (1997). **ඍග්වේද ගීතාවලී.** කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රාධාක්‍රිෂ්ණන්. (1970). **ඉන්දීය දර්ශනය- 1 කාණ්ඩය.** කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

වින්ටර්නීට්ස්. එම්. (1967). **ඉන්දීයසාහිත්‍යය ඉතිහාසය**. කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

සෝමාරාම, ගල්ගමුවේ. (1952). **සංස්කෘත සාහිත්‍යය (වෛදිකයුගය)** කැලණිය: විද්‍යාලංකාර මුද්‍රණාලය.

හෙට්ටි ආරච්චි. ඩී. ඊ. (1964). **පැරණි දඹදිව සාහිත්‍යය**. කොළඹ: නව ලිපිපොත් සමාජය.